# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2008/6 - 2017 පෙබරවාරි මස 27 වැනි සඳුදා - 2017.02.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : මඩු/ඉ/03/354.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4/3/9/2015/ඩබ්එස්/106.

මොනරාගල මඩුල්ල ජලසම්පාදන ක්‍රමයේ ගබඩා ටැංකියක් ඉදිකිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

ඌව පළාතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔබ්බෙගොඩ ගමේ පිහිටි මොනරාගල මැනුම් අධිකාරි විසින් පිළියෙල කර ඇති අ.ග.පි. අංක 594, අතිරේක අංක 23, පත්‍ර අංක 23 හි දැක්වෙන ඉඩම.

*උපලේඛනය*

01. **කැබලි අංක 1092**
ඉඩමේ නම: මහලිද්දේ වත්ත; හිමිකම් කියන්නා: රජය; මුල්හිමිකම් කියන්නා: විජයලත් පේලිගේ පත්මා, එම්. ඕ. එච්. පාර, සිරිවිජිතපුර, මොනරාගල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1012

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 මැයි මස 15 වැනි දින පෙ.ව. 10.00 ට මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තවද, 2017 අප්‍රේල් මස 05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි.

ආර්. එම්. ආර්. එස්. තිලකරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මඩුල්ල.

2017 පෙබරවාරි මස 22 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 - 457

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : අනු/17/5/3/9/5.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/9/2011/WS/322.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු කලාගම් කෝරළේ සුළු කොට්ඨාසයේ, විජිතපුර ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද, 2011.08.26 දිනැති අංක අවසාන ගම් පිඹුරු අංක 850 අතිරේක අංක 8 පත්‍ර අංක 10 දරන පිඹුරේ, කැබලි අංක 244 වශයෙන් දැක්වෙන "විජිතපුර ලන්ද" නැමති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0043 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

01. **කැබලි අංක 244**

ඉඩමේ නම: විජිතපුර ලන්ද; හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්: නාගුර් පිච්චේ මොහොමඩ් නිසාර්, පොල්වත්ත, විජිතපුර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0043

*මායිම්* :

*උතුරට*: 243 සහ 248 වැනි බිම් කැබලි; *නැගෙනහිරට*: 248 වැනි බිම් කැබැල්ල; *දකුණට*: 247 සහ 246 වැනි බිම් කැබලි; *බටහිරට*: 246, 245 සහ 243 වැනි බිම් කැබලි.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 මාර්තු මස 27 වැනි දින පෙ.ව. 10.30 ට ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තවද, 2017 මාර්තු මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි. හිමිකම්කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

එම්. එස්. එස්. සාජිදා බානු,
ප්‍රාදේශීය ලේකම්,
ඉපලෝගම.

2017 පෙබරවාරි මස 17 වැනි දින,
ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 - 458

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.